**Transript/ ප්‍රතිලේඛනය**

**බීබීසී සංදේශය - මේ අතර බ්‍රසල්ස් නුවරින් යුරෝපා සංගමයට ඉල්ලීමක් ඉදිරිපත් කරන ශ්‍රී ලංකා රජය ප්‍රකාශ කරන්නේ එල්ටීටීඊය පරාජය වුනත් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙමින් මුදල් රැස්කරන පුද්ගලයින් රහසින් පැටවීම වැනි ජාවාරම්වල වල නියුතු නොයෙක් දමරික කම් සිදුකරන සංවිධාන කිහිපයක් තහනම් කිරීමට ක්‍රියාත්මක වන ලෙසයි. එල්ටීටීඊය තවමත් තහනම්වී ඇති වාතාවරණයක් තුළ බ්‍රසල්ස්හි තානාපති රවිනාථ ආර්‍යසිංහ මහතා මෙම ඉල්ලීම පැහැදිළි කළේ මෙසේයි -**

ඒ සංවිධාන වෙන්කර හඳුනාගෙන තිබෙන්නේ අපි නොවෙයි. මේ යුරෝපා රටවල්ම ඒ සංවිධාන වෙන්කර හඳුනාගෙන තිබෙනවා.මොකද ත්‍රස්තවාදය ලංකාවේ 2009 මැයි මාසයේදී අවසන්වූ පසුව මම හිතන්නේ ත්‍රස්තවාදය නිසා අපි අත්අඩංගුවට ගෙන තිබෙන්නේ අතලොස්සක් පමණයි. නමුත් යුරෝපයේ මේ වන විට ඒ කාල රාමුව තුළ 37 පමණ පිරිසක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. 21 දෙනෙක් හිරේට නියම කරලා තිබෙනවා. එල්ටීටීඊ සංවිධානය තහනම් කරලා තිබෙනවා. ඉතින් ඒකෙන් පැහැදිළිව පෙනෙන්නේ මේ රටවල් පිළිගන්නවා, මේ රටවල් වලට පෙනෙනවා, මේ එල්ටීටීඊ සංවිධානය වෙනුවෙන් අද පෙනී සිටින්නේ ඔවුන්ගේ ප්‍රමුඛ සංවිධාන කියලා. ඒ නිසා අපි කියන්නේ ඒ බව සනාථ වෙලා තිබෙන මේ අවස්ථාවේ ඒ පිළිබඳව යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්න කියලා.

**බීබීසී සංදේශය - එනමුත් ටීආර්ඕ සංවිධානය තහනම් කළාට පස්සේ 'සුදු පරෙවියා' කියලා සංවිධානයක් පිහිටුවා ගත්තා. ඒවගේ දැන් වෙනත් නමකින් පෙනී සිටිමින් ඒ අරමුණු සඳහාම වෙනත් සංවිධාන පිහිටුවන්නට පුළුවන් තත්ත්වයක් තුළ මේ තහනමෙන් ප්‍රයෝජනයක් වෙයිද?**

ඒ තහනමෙන් ප්‍රයෝජනයක් වෙනවා, මොකද මම හිතන්නේ ත්‍රස්තවාදීන් සහ ත්‍රස්තවාදය මර්ධනය කරන්නට කටයුතු කරන රජයේ සහ ජාත්‍යන්තර ආයතනයන්ට තිබෙන අභියෝගයත් ඒකයි. එක දෙරකින් පනිනකොට අනෙක් දෙරෙන් අල්ලගන්න. ඒ පදනම මත තමයි අපි දැනට මේ බොහොම පැහැදිළිව ක්‍රියාකාරකම් වලට අහුවෙච්ච අය ඉන්න ටීආර්ඕ,ටීසීසී සහ ටීවයිඕ කියන මේ සංවිධාන තුන ගැන විශේෂයෙන් අවධානය යොමුකරන්න කියලා අපි ඉල්ලීම කරන්නේ. මොකද යුරෝපයේ මේ සංවිධාන තුන තමයි ප්‍රධාන වශයෙන්ම කටයුතු කරන්නේ.